ශ්‍රී ලංකාවේ එම්. ඒ. බී. අධ්‍යයන

# සත්ව සංහතිය සහ වෘක්ෂලතා පිළිබඳ පිරික්සුම් ලැයිස්තු සහ අත්පොත් පිළියෙල කිරීම

බී. ඒ. අබේවික්‍රම

තුලනාත්මක වශයෙන් බලන කළ, ශ්‍රී ලංකාව කුඩා රටක් වුවද, එය පාරිසරික තත්වයන් පුළුල් පරාසයකින්ද එහෙයින්ම පරිපූර්ණවූත්, උනන්දුව දනවන්නාවූත් වෘක්ෂලතා හා ශාක සන්තතියකින්ද සමන්විතව ඇත. එමනිසා ඉතා මුල් අවධියකදීම සුප්‍රකට විදේශීය විද්‍යාඥයින් රාශියක් මෙහි ආකර්ශණය වූහ. ලීනියස් විසින් ලීඩන්හි සිටියදී "ලංකා ශාක එකතුවක්" පිළිබඳව කටයුතු කර, 1747 දී ඔහුගේ " ප්ලෝරා සෙලනිකා' නම් කෘතිය ප්‍රකාශයට පත් කරන ලදී. ඔහුගේ ඇතැම් ශිෂ්‍යයෝ මෙහි පැමිණ, මෙම දිවයිනෙන් ශාක එක්රැස් කළහ. 1900 වර්ෂය වන විට, ලංකාව, මැනවින්ම උද්භිද විද්‍යාගතවූ නිවර්තනික දූපත් අතුරින් එකක් විය. එසේ වුවද ඔවුන් සොයා ගත් කරුණු සියල්ලම පාහේ, ප්‍රකාශයට පත් කරන ලද්දේ විදේශීය සඟරා වලය. ඒද බොහෝ විට යුරෝපා මහද්වීපික භාෂාවන් ගෙනි. ඒවායින් වැඩි කොටස ශ්‍රී ලංකාවේ එම කටයුතුවල ,නිරත වන්න වූනට වහා ප්‍රයෝජනය සඳහා ලබාගත නොහැකි විය. මෙම සාධකයත්, වෘක්ෂලතා හා සත්ව සංහතිය පිළිබඳ නියාමක හෝ අත්පොත් හිඟ හෝ කිසිසේත් නොමැති වීමත්, දිවයිනෙහි ජීව විද්‍යාත්මක ක්ෂේත්‍ර අධ්‍යයනයන්ට අති විශාල බාධකයක් විය.

මෙම ලිපියට විෂය වන ව්‍යාපෘතියේ මූලික අභිප්‍රාය, දේශීය ශාක සහ සතුන් පිළිබඳ පසුතල දැනුම සපයන ලිපි ලේඛන පිළියෙල කිරීමයි. 1977 වර්ෂයේදී ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය, කොළඹ විශ්වවිද්‍යාලයේ ජීව විද්‍යා පරීක්ෂණාගාර කේන්ද්‍ර කර ගෙන සිදු කෙරේ. මේ යටතේ ශාක නිදර්ශක එක්රැස් කර ඒවා හඳුනාගෙන, ඒ පිළිබඳව දැනට පවතින සියළු ලිපි ලේඛන රැස්කර අධ්‍යයනය හා සැසඳීම කරනු ලැබේ. මෙම තොරතුරු උපයෝගී කර ගනිමින්, විශේෂයන් පිළිබඳ පිරික්සුම් ලැයිස්තුද, ගණයනට සූචකද, ගණ පිළිබඳ විස්තරද, ඒවා හඳුනාගැනීම සඳහා අත්පොත් ද පිළියෙල කරනු ලැබේ. මහාචාර්ය බී. ඒ. අබේවික්‍රම (වෘක්ෂ ලතා අධ්‍යයන) සහ මහාචාර්ය කේ. ඩී. අරුද්ප්‍රගාසම් (සත්ව සංහති අධ්‍යයන) මෙහි සමායෝජකයන් වන අතර, මහාචාර්ය ආර්. එන්. ද ෆොන්සේකා, ආචාර්ය උමාරානී කුමාරස්වාමි මහත්මිය ආචාර්ය කාන්ති අබේනායක මහත්මිය, ආචාර්ය එස්. කොටගම, ආචාර්ය තෙල්මා ගුණවර්ධන මහත්මිය, රන්ජනී රත්නපාල මහත්මිය, පී. අරුල් ඥානම් මහත්මිය, එම්.ඒ. බී ජැන්සන් මහතා, අයි. කොතලාවල මෙනවිය සහ එල්. කේ. සේනාරත්න මහත්මිය ප්‍රධාන සහභාගිකයින් වෙති.

**වෘක්ෂලතා පිළිබඳ අධ්‍යයන :**

ඒකබීජපත්‍රී සුපුෂ්පක ශාක කුළ පිළිබඳ අත්පොතක් සම්පූර්ණ කරනු ලැබ දැන් මුද්‍රණය වෙමින් පවතී. ද්විබීජපත්‍රී ශාක පිළිබඳ අත්පොතක් පිළියෙල වෙමින් පවතී. ශ්‍රී ලංකාවේ සුපුෂ්පක ශාක නම් කෘතිය වෙනත් ව්‍යාපෘතියක් යටතේ සංශෝධනය කරගෙන යනු ලබන බැවින්, සුපුෂ්පක ශාක පිළිබඳව ගණ අනුව හා නිශ්චිත මට්ටම් අනුව කෙරෙන අධ්‍යයන මෙම ව්‍යාපෘතිය යටතේ ඉටු නොකෙරේ. විපුෂ්පක ශාක අතුරින්, පහත සඳහන් ඒවා පිළිබඳ පිරික්සුම් ලැයිස්තු සම්පූර්ණ කරනු ලැබ ඇත.

| | | |
|---|---|---|
| මිරිදිය ඇල්ගී | ගණ 160 | විශේෂ 580 |
| අක්මාශාක | ගණ 69 | විශේෂ 190 |
| පාසි | ගණ 174 | විශේෂ 575 |
| පර්ණාංග හා ඒ හා සාංගමික | ගණ 93 | විශේෂ 320 |
| ශාකයන්ගෙන් පරපෝෂිත දිලීර | ගණ 255 | විශේෂ 750 |
| හතු සහ බිම්මල් | ගණ 53 | විශේෂ 380 |
| පාංශු දිලීර | ගණ 63 | විශේෂ 150 |
| කෘමීන් ආශ්‍රිත දිලීර | ගණ 62 | විශේෂ 160 |
| මහා දිලීර | ගණ 106 | විශේෂ 530 |

ගණයනට නියාමක සහ අත්පොත් කිහිපයක්ද පිළියෙලකර ඇති අතර, මේ වන විට ප්‍රකාශන පිළිබඳ තත්වය මෙසේය.

(1) ශ්‍රී ලංකාවේ අක්මාශාක පිළිබඳ පිරික්සුම් ලැයිස්තුවක් (බී. ඒ. අබේවික්‍රම සහ එම්. ඒ. බී. ජැන්සන්) 1978.

(2) ශ්‍රී ලංකාවේ පාසි පිළිබඳ පිරික්සුම් ලැයිස්තුවක් (බී. ඒ. අබේවික්‍රම සහ එම්. ඒ. බී. ජැන්සන්) 1978.

(3) ශ්‍රී ලංකාවේ පර්ණාංග ශාක පිළිබඳ පිරික්සුම් ලැයිස්තුවක් (බී. ඒ. අබේවික්‍රම) 1978.

(4) ශ්‍රී ලංකාවේ ශාකයන්ගේ පරපෝෂිත දිලීර පිළිබඳ අත්පොතක් (යූ. කුමාරස්වාමි) 1979.

(5) ශ්‍රී ලංකාවේ හතු පිළිබඳ අත්පොතක් (යූ. කුමාරස්වාමි) 1979.

(6) ශ්‍රී ලංකාවේ මිරිදිය ඇල්ගී පිළිබඳ අත්පොතක්. (1 වන කාණ්ඩය) (බී. ඒ. අබේවික්‍රම 1980).

**මුද්‍රණය වෙමින් පවතින ප්‍රකාශන :**

(7) ශ්‍රී ලංකාවේ පාංශු දිලීර පිළිබඳ අත්පොතක් (යූ. කුමාරස්වාමි සහ ආර්. එන්. ද පොන්සේකා).

(8) ශ්‍රී ලංකාවේ සුපුෂ්පක ශාක කුළ (1 වන කාණ්ඩය) ඒක බීජ පත්‍රී ශාක (බී. ඒ. අබේවික්‍රම).

**සත්ව සංහතිය පිළිබඳ අධ්‍යයන**

ගොඩ ගොළුබෙල්ලන්, මදුරුවන්, උභයජීවීන්, උරගයින්, පක්ෂීන් සහ ක්ෂීරපායීන් පිළිබඳ පිරික්සුම් ලැයිස්තු සම්පූර්ණ කර ඇත. ඒ අතුරින් ඇතැම් ඒවා ප්‍රකාශයට පත් කරගෙන යනු ලැබේ. සමනළුන් (ගණ 128, විශේෂ 240) සහ කුහුඹුවන් (ගණ 64 විශේෂ 225) පිළිබඳ පිරික්සුම් ලැයිස්තුව සකසා නිම වෙමින් පවතී. උරගයින් ලැයිස්තුවට, කෙලෝනියන් කුළ 5 ක් සහ ගණ 8 ක් ද, කටුස්සන් කුළ 5 ක් සහ ගණ 27 ක්ද ඇතුලත්ය. මෙම කටුස්සන් ගෙන්, විශේෂයන් 13 ක් සහිත කුළ 7 ක් ඒකදේශික වෙති. ඊට අමතරව වෙනත් ඒක දේශික කටුසු විශේෂ 21 කි. මෙසේ ඒක දේශික විශේෂයන්ගේ එකතුව 34 කි. ගණ 47 කට අයත් නාග යින් ලේඛනගත කර ඇති අතර, ඉන් ගණ 4 ක් ඒකදේශික වෙති. ඒකදේශික නාග විශේෂයන්ගේ එකතුව 38 කි. දිවයිනෙහි කිඹුලන් තනි ඒකගණක පවුලකින් නියෝජනය වෙයි.

ගොඩ ගොළුබෙල්ලන්, පිළිබඳ පිරික්සුම් ලැයිස්තුවෙන් ප්‍රථම වරට ශ්‍රී ලංකාවේ මෙම කාණ්ඩයට අදල තොරතුරු එක්තැන් කරනු ලබයි. එයට කුළ 23 ක්ද ගණ 64 ක්ද, විශේෂයන් 266 ක් අයත් වෙති. ද

පිරික්සුම් ලැයිස්තුවලට අමතරව, උභයජීවීන් සහ ක්ෂීරපායීන් සම්බන්ධයෙන් රූප සටහන් සහිත ක්ෂේත්‍ර යතුරුද පිළියෙල කර ඇත. ක්ෂේත්‍රයේදී පහසුවෙන් දැකිය හැකි බාහිර ලක්ෂණ ඇතුලත් කරමින් විශේෂයන් පිළිබඳ කෙටි විස්තරද ගෙනහැර දැක්වේ. මෙමගින් මඳ තාක්ෂණික දැනුමකින් යුත් සාමාන්‍ය පුද්ගලයින්ට විශේෂයන් ක්ෂණිකව හඳුනා ගැනීමට ආධාර ලැබේ.